දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
DISTANCE AND CONTINUING EDUCATION UNIT - UNIVERSITY OF RUHUNA

සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධි ද්විතීය භාග (බාහිර) පරීක්ෂණය - 2013 මාර්තු
GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) PART II - MARCH 2013

# සිංසා 3.1 - සම්භාව්‍ය සිංහල ගද්‍ය කාව්‍යය
# SLG 3.1 - Classical Sinhala Prose

කාලය පැය තුන යි

**පළමු වන ප්‍රශ්නය ඇතුළු ව <u>ප්‍රශ්න පහකට</u> පිළිතුරු සපයන්න**
**(නො පැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු විය හැකි ය.)**

---

01. i. පහත දැක්වෙන ඡේද වත්මන් සිංහලයට නගන්න.
ii. ඉරි ඇඳි පදවලට විවරණ සපයන්න.

(අ) එකල්හි සිටිහු ගෙ පරිජනයො 'ස්වාමිය, ගෙ අගණයෙහි සැඬෙලෙක් හොත්තෙයැ' යි කීහ. 'කුමට හොත්තෙ දොහොයි ගොස් පිළිවිසැ බලා, මෙ මස්ස උහුට දී නඟා පියව' යි යවීයැ. ජනයො ගොස්, 'මෙ මස්ස ගෙනැ නැඟී යා'යි කීහ. 'මම් මස්සක් නිසා හොත්තෙම් නොවෙමි. දිටිය මඞ්ගලිකාව නිසා හොත්තෙමි' කීයැ. 'ඇය කවර වරදැ'යි කීහැ. 'මා නිරපරාධයා හට ඇය ගැත්තන් කළ දැ නො දක්ව? ඇය ලද, හොත් තැනින් නැඟෙමි. නො ලද නො නැඟෙමි'යි කීයැ. සිටි එපවත් අසා දුවගෙ දොස් බව් දැනැ එක් කහවුනක් දී යවීයැ. 'මම දැරිය කැමැත්තෙමි. කහවුනු නො කැමැත්තෙමි' කීයැ. සිටි ද සිටි දූ ද 'අප සැනැහැති ඒක මැ දුවැ. වංස රක්නට නිසි අනෙක් දරුයෙක් ඇත්තෙ නො වෙ' යි බිය පත් වැ 'යව, දරුයෙනි, අප <u>නොසහන</u> යමෙක් ඔහු මැරුයෙ වී නම් ඇප් හැම දෙනමො නස්මහ. ඔහු රක්ව' යි වටා ඔහට රකවල් දෙවා හඹු දී යවූහැ. බත් දී යවූහැ. (ධන දී යවූහැ.) හෙ එයිදු පිළිබෙව් කෙළෙ. මෙ නියායෙන් දවස් යත් යත්, දෙපස්හි සත් සත් ගෙහි මිනිස්හු නැඟී, 'ඇපි තොප නිසා සැඬල් වන්නට නො නිස්සම්හ අප නො නසව. දැරිය දී උහු හොත් තැනින් නඟා පියව' යි කීහ. උහු ක්‍රමයෙන් සියක් දී දහසක් දී ලක්ෂයක් දී යවූහැ. හෙ එයිදු පිළිබෙව් කෙළෙ.

(අමාවතුර, කෝදාගොඩ ඤාණාලෝක හිමි සංස්.)

(ආ) එකෙණෙහි මුහුදු දියකඳ දවා ගෙණැ වඩබාමුඛයෙන් පිටත් වැ ගිය අවීචියෙහි ගිනිකඳක් සේ රළු මතැත්තෙම සොඬ හකුළුවා මහපොළොව යදඬෙකින් ගැසූ සණ්ඨාවක් සේ අනුරාව දෙවමින්, ගිගිරූ හඬින් මුළුනුවර අසනිපාතයක් සේ තතුණුවමින්, කෝපයෙන් පය බැඳ ලූ කෙණෙහි මැ මකුළු හුයක් කඩන්නා සේ යදම බිඳැ සුණුවිසුණු කෙරෙමින්, නෙළුබුදැලියක් උපුරන්නා සේ බැඳ ලූ තඹය පෙරළී සිට ඇනැ තුතු කෙරෙමින්, සිටි ඇත් හල පැහැරැ ධූලි කෙරෙමින්, බිඳලූ <u>තඹය</u> කඩා හකුළුවා දළහස්සෙහි තබා ගෙණැ, තමාගේ සේයට ඇනැලූ ඇත්මෙත් මහපොළොව දැදුරු කොට, දළැ ඇවිළැ ගත් පසින් භයඞ්කර වැ, නිය අක් පහරින් මහපොළොව කැණැ, ඒ පස් ගෙණැ පිටට ඉස්මින්, දිවැ ලුහුබඳවා අල්වා පලාපූ මිනී දළගැ අවුණා නඟමින්, ලෙහෙයෙන් රැඳී ගිය මුහුණින් ලෙහෙයෙන් රැඳී ගිය දළින් ගොන් මීවුන් ලුහු බඳවා ගෙණැ ඇනැ පළමින්, ඔවුන්ගේ අතුණුබහනින් වෙළී ගිය දළින් බැලූ බැලූවන් ඇස් පියවමින්, කොපයෙන් සොඬ කටැ ලා ගෙණැ හිස සලසලා ගුගුරමින්, දොරටු අටලු පවුරු පදනම් ඇනැ හෙළා සුණුවිසුණු කෙරෙමින් අවුත් වීථියට වැදැ ගියේ යැ.

(බුත්සරණ, වැලිවිටියේ සෝරත හිමි සංස්.)

(ඈ) ලියන්නහු ලියාලූ පත් කඩෙහි රජ්ජුරුවන් ශ්‍රී ඔප්පුව නිසා ඒ තෙමේ <u>සත්හස්</u> වී ද, එපරිද්දෙන් මේ වස්තුවත් බුද්ධ භාසිත නම් වී යයි මෙසේ මට්ටකුණ්ඩලී වස්තුව වදාරාලා, 'හෙම්බල බමුණ, අසන දෙයටත් වඩා දුටු දෙය ප්‍රත්‍යක්ෂ ය. එතෙකුදු වුවත් අත් දුටු බෙහෙත් තිබිය දී ඔබ්බේ බෙහෙත් විචාරන්නා සේ ම මා අතිනුත් විචාරතු, පසු මා කෙරෙහි සිත් පහදවා දෙව්ලොව උපන්නවුන් සිය ගණනිනුත් දහස් ගණනිනුත් ලක්ෂ ගණනිනුත් නිම කරන්ට බැරි ය. අසඞ්ඛ්‍ය ගණනට ඇති හෙයිනැ'යි වදාළ සේක. ඒ අසා ආර්යයන් හැර සෙස්සෝ මුළුල්ල ම 'මේ කිම් දැ යි බුදුන්ගේ තරම නො දැන නො හදහන්නට වන්හ. උන් හැම දෙනාගේ නො හැදහිල්ල හරවන නිසාත් දෙස් කීවවුන්ට දෙන අත්ලසක් සේ උන්ට ලොව්තුරා සම්පත් දෙවනු නිසාත් 'මට්ටකුණ්ඩලී දෙව් පුත් තමාගේ දිව සැපතින් පිරුණු මාළිගාව හා සමඟ එව'යි සිතා වදාළ සේක.

(සද්ධර්මරත්නාවලිය, ප්‍රාචීන භාෂෝපකාර සමිතිය සංස්.)

(ඈ) එසඳ ප්‍රභාවතීන් 'එසේය පියාණන් වහන්ස, උන්වහන්සේ මෙනුවරට අවුත් රාජකුමාරිකාවරුන්ට අරක්කැමිකම් කරන්නේ දැන් සත් මසෙකැ'යි කිවුය. මදු රජ්ජුරුවෝ උන්ගේ බස් අදහා නොගෙන කුද කැඳවා විචාරා නියම කොට දැන එළඹ තෙල වෙස්වළා මුදු වෙසින් පැමිණි විෂ ඝෝර සර්ප රාජයකු පරිද්දෙන් සකල භුවන සෙබඟ වූ විශිෂ්ට කාය බල ඥාණබල ඇති ඒ කුස රජ්ජුරුවන් වෙස් වළා තොප නිසා මීට අවුත් සත් මසක් මුළුල්ලෙහි දුක් ගනිමින් සිටියදී අපට නොකියා කළ දෑ ඒකාන්තයෙන් වැරැද්දේය'යි යනාදීන් දියණියන්ට දොඩා වෙගයෙන් ඉක්මන් ව බොධිසත්ත්වයන් කරා ගොස් සුවදුක් විචාරා <u>බද්ධාඤ්ජලීව</u> සිට 'මහ රජ්ජුරුවන් වහන්ස සත් මසක් මුළුල්ලෙහි දුක්ගනිමින් සිටියදී තුඹවහන්සේ වෙස්වළා අවුත් මෙගම සිටි බව නොදනුම්හ. ඒ අප නොදැන කළ අපරාධය ක්‍ෂමා කොට වදාළ මැනවැ'යි යාච්ඤා කළා.

(පන්සිය පනස් ජාතක පොත, වේරගොඩ අමරමෝලි සංස්.)

(ලකුණු 28 යි)

02. තත්කාලීන සමාජ අවශ්‍යතා පිළිබඳ ව අවධානය යොමු කරමින් ගුරුළුගෝමීන් කතාකලාව සකසා ගෙන ඇති අයුරු <u>අමාවතුර</u> ඇසුරෙන් පැහැදිලි කරන්න.

03. 'ස්වකීය අරමුණ සාධනය කර ගැනීමට උචිත පරිදි විද්‍යාචක්‍රවර්ති <u>බුත්සරණෙහි</u> රචනා විලාසය මැනවින් නිර්මාණය කොට ඇත.' විමසන්න.

04. <u>සද්ධර්මරත්නාවලියෙහි</u> එන මට්ටකුණ්ඩලී හා පටාචාරා යන කතාවස්තු ඇසුරින් ධර්මසේන හිමියන්ගේ කතා කලාවේ විශේෂතා සනිදර්ශන ව හඳුන්වා දෙන්න.

05. <u>එක්කෝ</u>

'පුහුදුන් මිනිසාට ඝොරතර සසරින් මිදී විමුක්තිය ළඟා කර ගැනීමට පන්සිය <u>පනස් ජාතක පොතෙන්</u> මහඟු උපදෙස් ලැබෙයි' තියමිත ජාතක කතා ඇසුරින් පහදා දෙන්න.

<u>නැතහොත්</u>

'තම අරමුණු සාධනය කර ගැනීම උදෙසා අප්‍රතිහත ධෛර්යයෙන් ක්‍රියා කළ පරමාදර්ශී චරිතයක් ලෙස කුස රජු අගය කළ හැකිය' <u>පන්සිය පනස් ජාතක පොතේ</u> එන කුස ජාතකය ඇසුරින් විමසන්න.

06. සම්භාව්‍ය සිංහල ගද්‍ය සාහිත්‍ය සම්ප්‍රදාය සැකසී ඇති ආකාරය චිරන්තන ගද්‍ය සාහිත්‍ය කෘති ඇසුරට ගනිමින් සාකච්ඡා කරන්න.

(02 - 06 ප්‍රශ්නවලට ලකුණු 18 බැගිනි)

●●●●●●●●●●●●●●●●●●●●●●●●●●●●●●●●●●●●●●●●●●●●●●